# කෘෂි ක්ෂේත්‍රයේ ගැටලු හඳුනා කඩිනම් ගමනක් යා යුතු

**හදා වඩා ගන්නා ගම්මිරිස් පැළ නිසි ලෙස පෝෂණය කර නඩත්තු කිරීමෙන් පරම්පරා ගණනක් තිස්සේ වුවද සරු ආදායම් ලැබිය හැකි මාර්ගයක් බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පවසයි. නෙලා ගන්නා හැම ගම්මිරිස් ඇටයක්ම කළු පැහැයට හරවා ගනු ලබන තාක්ෂණය ගොවීනට ලබා දීමට දෙපාර්තමේන්තුව සූදානමින් සිටියි. වෙළඳපොළේ ඉහළ ඉල්ලුමක් සඳහා එකී ඒකාකාර පැහැය හා රසය අත්‍යවශ්‍ය සාධකයකි. මාතලේ ඇලවල පිහිටි පර්යේෂණාගාරයේදී පර්යේෂණ නිලධාරී එස්.පී. ප්‍රේමතිලක මහතාගේ මූලිකත්වයෙන් සිදු කෙරෙන නව අත්හදාබැලීමක් ගැන දැනගන්නට ලැබිණි. එහිදී නිපැයෙන ගම්මිරිස් ඇටය සුදු පැහැ වන අතර බරින් අඩු එහෙත් සාම්ප්‍රදායික සැර රසයෙන් බැහැර ස්වභාවයක් උසුලයි.**

කුළුබඩු සඳහා ශ්‍රී ලංකාව සතුව ඇත්තේ ඉපැරණි ඉතිහාසයකි. පැල්පතේ ද, මැදුරුවල ද දීර්ඝ කාලයක් රැඳී සිටීමට මේ කුළු බඩුවලට හැකිවී ඇත්තේ ඒවායේ පවතින සුවඳ හා එමගින් ආහාරවලට ලබා දෙන රසය නිසාම නොව එහි අන්තර්ගතයේ ඇති ගුණය මිනිස් සිරුරට හිතකර හා ඖෂධීය ගුණයෙන් පිරිපුන් බව පැරැන්නෝ දැන සිටි බැවිනි. මේ නිසාම ලක්බිමේ වැවෙන ගම්මිරිස්, කුරුඳු, කරදමුංගු කරාබුනැටි හා සාදික්කා ආදියට ඇති ඉල්ලුමේ වැඩිවීමක් වාර්ෂිකව දැකගත හැකිය. මීට අමතරව කෝපි හා කොකෝවා ද කුළුබඩු ගණයට අයත් නොවුවත් අපනයන කෘෂි බෝගයක් ලෙස මෙරටට හොඳ විදෙස් විනිමයක් ලබාදීමට දායකවී ඇත.

මෙකී බෝගයන් ඉහළ තාක්ෂණය අනුසාරයෙන් උසස් හා වැඩි ඵලදාවක් ලැබෙන අයුරින් පර්යේෂණාත්මකව දියුණු කිරීමේ ජාතික කර්තව්‍යයට උරදී සිටිනුයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවයි.

## කරදමුංගු

මෙම දෙපාර්තමේන්තුවට අයත් දිවුලපිටිය වල්පිට පිහිටි පටක රෝපණ මධ්‍යස්ථානය උසස් ගුණයෙන් යුත් පැළ වර්ග බිහි කරන තිඹිරි ගෙය ලෙස හැඳින්විය හැකිය. උතුරු නැගෙනහිර හා උතුරු මැද පළාත් හැර තෙත් කාලපයට අයත් සෙසු ප්‍රදේශයන්හි වගා කරුවන් සඳහා පැළ නිකුත් කිරීම මෙහිදී සිදුවේ.

මේ අතරින් ප්‍රමුඛ පෙළේ අපනයන බෝගයක් වන කරදමුංගු වගාව සඳහා උසස් ආරයේ පැළ පටක රෝපණ ක්‍රම මගින් ලබා ගැනීමේදී වැඩි පැළ ප්‍රමාණයක් මෙන්ම අඩු කාලයකදී වැඩි මුල් ප්‍රමාණයක් ලැබෙන ලෙස අදාළ රෝපණ මාධ්‍යය වෙනස් කර ඇත. මවු ශාඛයේ ගුණයම ඉදිරියට ගෙන යාහැකි පැළ වැඩි ප්‍රමාණයක් ලබා ගත හැකිවීම පටක රෝපණ ක්‍රමයේ ඇති විශේෂත්වයයි.

දැනටමත් කුරුවිට හා ඇහැලියගොඩ ප්‍රදේශයන්හි රබර් යටි වගාවක් ලෙස කරදමුංගු වගාව සිදුවේ. මුහුදු මට්ටමෙන් අඩි 3500ට ඉහළ ප්‍රදේශ කරදමුංගු වගාවට යෝග්‍ය නොවේ. 1998 අගෝස්තු වන විට කරදමුංගු මෙට්‍රික් ටොන් 5.2 ක් අපනයනය කිරීමෙන් රුපියල් මිලියන 4.3ක විදේශ විනිමයක් උපයා ඇත.

## ගම්මිරිස්

එසේ වුවත් ගම්මිරිස් පැල ලබා ගැනීම සඳහා අනුගමනය කෙරෙන ක්‍රමය එතරම් සංකීර්ණ නොවේ. ඒ සඳහා පටක රෝපණ ක්‍රමය ද අවශ්‍ය නොවේ. කොහුබත් හා ගොම 3-1 මිශ්‍රණය මත අතු කැබැල්ල හෝ පැළයවැඩෙන්නට ඉඩ හරියි. උණ බම්බුවක් දෙකට පැලීමෙන් ඒ තුළ වුව ද ගම්මිරිස් පැල රෝපණය කළ හැකිය.

බුබුලු ගම්මිරිස් සඳහා ඉන්දියාවෙන් විශාල ඉල්ලුමක් ඇතත් එය ශ්‍රී ලංකාව පැත්තෙන් ඉතා අහිතකර ප්‍රවණතාවකි. හේතුව නිසි කලට පෙර නෙලාගත්තා එම ගම්මිරිස් මාස තුනකට පසුව බරින් තුන්ගුණයක් දක්වා වැඩි වීමයි. වෙනත් වචනවලින් කිවහොත් ලැබිය යුතු ආදායමින් 2/3ක් අහිමිවීමයි. එහෙත් ගොවීන් මේ සඳහා පෙළඹීම නවතාගත නොහැකි ගැටළුවක් වී ඇත. සතුන්ගෙන් බේරා ගැනීමට සිදු නොවීමත්, වියලා සකස් කර ගැනීම ආදී කටයුතු වලින් නිදහස් නිසාත්. ඉක්මනින් අතට මුදල් ලැබෙන නිසාත් ගොවීන් මීට රුචි වුවද රටක් වශයෙන් එය කෘෂිකර්ම අපනයන ක්ෂේත්‍රය මුහුණපාන ඛේදනීය තත්ත්වයකි.

මෙසේ හදා වඩා ගන්නා ගම්මිරිස් පැළ නිසි ලෙස පෝෂණය කර නඩත්තු කිරීමෙන් පරම්පරා ගණනක් තිස්සේ වුවද සරු ආදායම් ලැබිය හැකි මාර්ගයක් බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පවසයි. නෙලා ගන්නා හැම ගම්මිරිස් ඇටයක්ම කළු පැහැයට හරවා ගනු ලබන තාක්ෂණය ගොවීනට ලබා දීමට දෙපාර්තමේන්තුව සූදානමින් සිටියි. වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් සඳහා එකී ඒකාකාර පැහැය හා රසය අත්‍යවශ්‍ය සාධකයකි. මාතලේ ඇලවල පිහිටි පර්යේෂණාගාරයේදී පර්යේෂණ නිලධාරී එස්.පී. ප්‍රේමතිලක මහතාගේ මූලිකත්වයෙන් සිදු කෙරෙන නව අත්හදාබැලීමක් ගැන දැනගන්නට ලැබිණි. එහිදී නිපැයෙන ගම්මිරිස් ඇටය සුදු පැහැ වන අතර බරින් අඩු එහෙත් සාම්ප්‍රදායික සැර රසයෙන් බැහැර ස්වභාවයක් උසුලයි.

විවිධ රස රුචියවුනට සරිලන සේ මේ නිෂ්පාදනයන් මෙසේ නව මංපෙත් සොයා නොගියොත් වත්මන් තරඟකාරී ලෝක වෙළඳ රටාව තුළ අප හුදෙකලා වීමට ඉඩ ඇත. මේ මගින් එය ඇසිරි යන බව පැහැදිලිය. ඉපදෙන්නට පෙර මාස 3 1/2 න් පමණ නෙලා ගෙන සකසනු ලබන මේ ක්‍රමයෙන් ගම්මිරිස් ඇටයේ රවුම් හැඩය නොහැකිළී එලෙසම පවතී.

ගම්මිරිස් නෙලාගැනීමෙන් පසුව කරලින් ඇට වෙන් කිරීම සඳහා දේශීය තාක්ෂණය උපයෝගී කැර ගත් නව යන්ත්‍රයක් හඳුන්වා දී ඇත. එමගින් පැයට කි.ග්‍රෑම්. 300 ක් පමණ ඇට වෙන්කළ හැකි අතර ඉතිරි වනුයේ 2%කටත් අඩු ඇට ප්‍රමාණයකි. විදුලි බලයෙන් ක්‍රියාත්මක වන මේ යන්ත්‍රයක මිල රු.31,000/ක් වන අතර එයින් රු.10,000/ක් මූල්‍ය සහනාධාරයක් ලෙස දෙපාර්තමේන්තුව ලබා දෙයි. දැනටම මෙවැනි යන්ත්‍ර 25ක් පමණ මාතලේ දිස්ත්‍රික්කය තුළ පමණක් අලෙවි වී ඇති අතර තවත් ඇණවුම් ලැබෙමින් පවතින බව ද පැවසේ.

තේමා ලිපි

තාරම්මල පිහිටි බුලත් හා අතුරු බෝග පර්යේෂණ මධ්‍යස්ථානය මගින් සාම්ප්‍රදායික සූරියා පොහොර වෙනුවට බුලත් වගාව සඳහා නව පෝර මිශ්‍රණයක් හඳුන්වා දී ඇත. නව තාක්ෂණික උපක්‍රම සොයන අතරම ඉපැරණි වගා ක්‍රමයන්ගෙන් උකහා ගත හැකි දේ අධ්‍යයනය කිරීමට දෙපාර්තමේන්තුව මැලිනොවෙයි. බුලත් වගාවක් ආසන්නයේ "දාස්පෙති" මල් වගා කිරීමෙන් කෘමි හානි වළක්වා ගත හැකි බවට ඇති විශ්වාසය ඔවුහු බැහැර නොකරති. එමගින් නිකුත් කැරෙන සුගන්ධය කෘමීනට අප්‍රසන්නවීම ඊට හේතුව විය හැක. කෙසේ වෙතත් මේ වසරේ ජූල් මාස අට තුළ පමණක් මෙ.ටො. 1060.6 ක් පිටරට යවා රුපියල් මිලියන 28.1 ක ආදායමක් ලබා දුන් බුලත් වගාවේ දක්නට ලැබෙන බැක්ටීරියා රෝගයට නිශ්චිත ප්‍රතිකර්මයක් තවමත් සොයාගෙන නැත.

බුබුලු ගම්මිරිස් සඳහා ඉන්දියාවෙන් විශාල ඉල්ලුමක් ඇතත් එය ශ්‍රී ලංකාව පැත්තෙන් ඉතා අහිතකර ප්‍රවණතාවකි. හේතුව නිසි කලට පෙර නෙලාගන්නා එම ගම්මිරිස් මාස තුනකට පසුව බරින් තුන්ගුණයක් දක්වා වැඩි වීමයි. වෙනත් වචනවලින් කිවහොත් ලැබිය යුතු ආදායමින් 2/3ක් අහිමිවීමයි. එහෙත් ගොවීන් මේ සඳහා පෙළඹීම නවතාගත නොහැකි ගැටළුවක් වී ඇත. සතුන්ගෙන් බේරා ගැනීමට සිදු නොවීමත්, වියළා සකස් කර ගැනීම ආදී කටයුතු වලින් නිදහස් නිසාත්, ඉක්මනින් අතට මුදල් ලැබෙන නිසාත් ගොවීන් මීට රුචි වුවද රටක් වශයෙන් එය කෘෂිකර්ම අපනයන ක්ෂේත්‍රය මුහුණපාන ඛේදනීය තත්ත්වයකි.

කෙසේ වෙතත් 1998 අගෝස්තු වන විට ගම්මිරිස් මෙ.ටො.4778ක් අපනයනය කර රුපියල් මිලියන 1308 ක් උපයා ගැනීමට ශ්‍රී ලංකාව සමත්ව සිටියි.

## කුරුඳු

මුළුතැන්ගෙයි දැකිය හැකි තවත් රසකාරකයකි කුරුඳු. කලක් දකුණු මුහුදුබඩ පමණක් වැවෙතැයි විශ්වාසයක් පැවතිය ද අනෙකුත් ප්‍රදේශයන්හි ද සාර්ථකව වැවීමෙන් දැන් ඒ මතය බිඳ වැටී ඇත. පහසුවෙන් ස්ථාපනය කළ හැකිවීම කුරුඳු වගාවේ ඇති විශේෂත්වයයි. අඩි හතක පමණ උසේදී කප්පාදු කිරීම සුදුසු බව සාර්ථක පර්යේෂණ අංශ පෙන්වා දෙයි. ලොව එකම කුරුඳු පර්යේෂණ ආයතනය පිහිටා ඇත්තේ ද ශ්‍රී ලංකාවේය. කඹුරුපිටිය මාපලාන ප්‍රදේශයේ එය පවත්වාගෙන යයි. අපනයන බෝග අතරින් 65%ක් අයත් වනුයේ කුරුඳුවලට වන අතර ලෝක කුරුඳු නිෂ්පාදනයෙන් 75%ක් ශ්‍රී ලංකාවෙනි.

මෙරටින් ඉන්දියාවට කුරුඳු අපනයනය කිරීමේදී විශේෂ සහනයක් එරටින් සලසා තිබිණි. එහෙත් ඇතැම් වංචනික ව්‍යාපාරිකයන් විසින් වෙනත් රටවලින් ගෙන ආ කුරුඳු මෙරට ලේබලය යටතේ ඉන්දියාවට පටවා අනිසි සහන ලබා ගැනීමට යෑමෙන් ශ්‍රී ලාංකීය කුරුඳු සඳහා ලෝක වෙළෙඳපලේ තිබූ කීර්තිනාමයට හානි වී ඇතුවා පමණක් නොව ඉන්දියාවෙන් දී තිබුණු සහනයද අහිමිව ගියේය.

කුරුඳු හා සම්බන්ධ තවත් භයානක අනතුරු ඇඟවීමක් ගැන අසන්නට ලැබේ. මැඩගස්කරය මෑතදී කුරුඳු බීජ ටොන් 600ක් මෙරටින් ඉල්ලා ඇත. යම් ලෙසකින් එයින් තුනෙන් පංගුවක් හෝ සපයනු ලැබුවහොත් මෙරට කුරුඳු අනාගතය නිශ්චිතවම අවසන් ගමන් යන බව අධ්‍යක්ෂ කුලරත්න මහතා අවධාරණය කරයි. මේ නම් නොපමාව අදාළ

වගාකිවයුත්තන්ගේ අවධානය සැළුවම යොමුවිය යුතු කරුණකි. පසුගිය අගෝස්තු දක්වා වූ අපනයන දත්තයනට අනුව කුරුඳු මෙ.ටො. 5110.7 ක් අපනයනය කිරීමෙන් රුපියල් මිලියන 2037.1ක ආදායමක් ලැබීමට හැකිවී ඇත.

## බුලත්

තාරම්මල පිහිටි බුලත් හා අතුරු බෝග පර්යේෂණ මධ්‍යස්ථානය මහින් සාම්ප්‍රදායික යූරියා පොහොර වෙනුවට බුලත් වගාව සඳහා නව පෝර මිශ්‍රණයක් හඳුන්වා දී ඇත. නව තාක්ෂණික උපක්‍රම සොයන අතරම ඉපැරණි වගා ක්‍රමයන්ගෙන් උකහා ගත හැකි දේ අධ්‍යයනය කිරීමට දෙපාර්තමේන්තුව මැලිනොවෙයි. බුලත් වගාවක් ආසන්නයේ "දාස්පෙති" මල් වගා කිරීමෙන් කෘමි හානි වළක්වා ගත හැකි බවට ඇති විශ්වාසය ඔවුහු බැහැර නොකරති. එමහින් නිකුත් කැරෙන සුගන්ධය කෘමීනට අප්‍රසන්නවීම ඊට හේතුව විය හැක. කෙසේ වෙතත් මේ වසරේ මුල් මාස අට තුළ පමණක් මෙ.ටො. 1060.6 ක් පිටරට යවා රුපියල් මිලියන 28.1 ක ආදායමක් ලබා දුන් බුලත් වගාවේ දක්නට ලැබෙන බැක්ටීරියා රෝගයට නිශ්චිත ප්‍රතිකර්මයක් තවමත් සොයාගෙන නැත.

පොල් වගාවේ යටි අතුරු වගාවන් ලෙස ගම්මිරිස් කොකෝවා හා බුලත් ආදී. අපනයන බෝග වැවීම එම වගාවන්ට මෙන්ම ප්‍රධාන වගාවට ද (පොල්)හිතකර බව දෙපාර්තමේන්තුවේ අදහසයි. ඇතැම් විට පොල් වගාවට වැඩි වාසි අත්වන බව ද හිරු එළිය අතුරු බෝගයට හිතකර වන අතරම වගාවන් දෙකට වෙන වෙනම යොදන පෝර බෝග දෙකටම අන්‍යෝන්‍ය උපකාරිත්වය සලසයි.

පොල් වගාව බහුලව පවතින වයඹ පළාත තුළ අතුරු බෝග වගාවට ඇති බාධාවක් වනුයේ පොල්වතු හිමියන් බහුතරයක් පිට පළාත්වල විසීමයි. දෙපාර්තමේන්තු උපදේශක සේවාවන් හා සම්බන්ධීකරණයක් ඇති නොවීම නිසා අවශ්‍ය සත්කාරයන් නිසි කලට නොලැබී යෑම සැලුවම අතුරු බෝග වගාවට අහිතකර ප්‍රතිඵල ගෙන දෙන්නකැයි නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) ආචාර්ය මහානාම ඉලංගසිහ පවසයි.

## කෝපි

උණුසුම් කෝපි කෝප්පයකින් ගත සිත ප්‍රබෝධවත් වන මොහොතක වුව උසස් රසයෙන් හා ගුණයෙන් යුතුව එය නිෂ්පාදනය කිරීමට වෙර දරන ගොවියාගේ හෝ නිෂ්පාදකයාගේ කාර්යභාරය අපට සිහිපත් නොවේ. මුහුදු මට්ටමින් අඩි 2000-2500 අඩු මට්ටමේ වගාවන් සඳහා රොගස්ටා ද ඊට ඉහළ මට්ටමේ වගාව සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගාකරුවන් දිරි ගන්වයි. ඇට පමණක් ඉවත් කර ගත හැකි කෝපි පල්පරය නම් වූ යන්ත්‍රය චීනයේ නිෂ්පාදනයක් වන අතර මුදලින් රු.8500/ක් වුවත් දෙපාර්තමේන්තුව එයින් රු.5000/ක් ම සහනාධාරයක් ලෙස ලබා දෙයි.

මේ ක්ෂේත්‍රයේ ආර්ථික වටිනාකම මැනැවින් වටහා ගත් රජය 1998 වසර සඳහා රු. මිලියන 200 ක මුදලක් කෘෂිකර්ම අපනයනය ක්ෂේත්‍රයේ දියුණුවට වෙන් කර ඇත. දෙපාර්තමේන්තුවේ ඉලක්කය වනුයේ ක්‍රි.ව. 2005 වන විට අපනයන ප්‍රමාණය 6% සිට 15% දක්වා වැඩි කර ගැනීමයි. වසරකට හෙක්ටයාර් 2000 බැගින් අලුතින් හෙක්ටයාර් 13,5000 ක් වගාකිරීමෙන් මෙයින් හෙක්ටයාර් 9000ක් වතු සමාගම්වල කළමනාකරණය හා සහයෝගීතාවෙන් වතු ආශ්‍රිතව සිදු කිරීමටත් අරමුණු කර ඇත. දැනටමත් එවැනි වතු 71 ක ක්‍රියාත්මකව පවතී. ඉතිරි හෙක්ටයාර් 4500 සුළු පරිමාණයේ වගාකරුවන් 15,000 ක් ආවරණය වන පරිදි ක්‍රියාවට නැංවෙනු ඇත.

අපනයන කෘෂි වගාකරුවන් සඳහා ලබා දෙන සහනාධාරයන් වැඩිකිරීමටත් ඔවුන් සඳහා යෝජිත නව රක්ෂණ ක්‍රමය 1999 වසර තුළ ඇරඹීමටත් දෙපාර්තමේන්තුව අදහස් කරයි. මේ සියලු සැලසුම් මහින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවක් එමහින් රටත් බලාපොරොත්තු වන්නේ උසස් තත්ත්වයේ බෝග විදේශ වෙළඳපොළට ඉදිරිපත් කරන අතරම විදෙස් විනිමය වැඩි ප්‍රමාණයක් උපයා ගැනීමයි. ඒ සඳහා යන මේ දුෂ්කර ගමනේදී ඔවුන් මුහුණපා ඇති වෙළෙඳ පොළ ආශ්‍රිත ආර්ථික ගැටලු ජය ගැනීම සඳහා ඉහළ පෙළේ රාජ්‍ය මැදිහත්වීමක අත්‍යවශ්‍යතාව අවධාරණය කළ යුතුව තිබේ.